වලපනේ ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 25 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 27 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පතු ශේෂය ලෙසට ඉකුත් වර්ෂයේ ඇප තැන්පතු ශේෂය රු.135,058 ක් දක්වා තිබුණු අතර, සේවක ඇප පාස් පොත් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ). ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.725,000 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,725,000 ක් ලෙසට රු.1,000,000 ක් වැඩිපුර දක්වා තිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු.81,365 ක් අදාල වැය සංකේතයට හර නොකර ණයගැති ගිණුමකට හර කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම එම වටිනාකමින් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ). ජර්නල් සටහන් අංක 20 මගින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ගිණුම රු.668,887 කින් හර හා පොදු සැපයුම් ණයහිමි ගිණුම බැර ලෙසට සටහන් තබා තිබුණද, එම බැර සටහන පමණක් ණයහිමි ගිණුමේ දක්වා තිබුණු බැවින් ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙනත් ආදායම් ශේෂය රු.4,542,737 ක් වුවද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.3,626,542 ක් ලෙස රු.916,195 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ආදායම් ශේෂය රු.8,036,448 ක් හා වෙනත් ආදායම් ලේඛනය අනුව එම ශේෂය රු.7,782,448 ක් වූ බැවින් රු.254,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.24,530,918 ක් වූ අතර ඉන් රු.10,206,080 ක් වසරක කාලයක් ඉක්මවා අය නොවී පැවතුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.34,361,731 ක් වූ අතර, ඉන් රු.18,481,611 ක් වසරක කාලයක් ඉක්මවා පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති රු.27,712,522 ක ගිණුම් විෂයයන් 12 ක් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | මුදල් රෙගුලාසි 571 | කර්මාන්ත සඳහා අයකරනු ලැබූ තැන්පතු 06 ක රු.284,503 ක් වූ මුදලක් වසර 02 ක් ඉක්මවා තිබුණද, ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 වන වගන්තිය | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලබාගිය, සේවය හැරගිය හා මියගිය නිලධාරීන්/ සේවකයින් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.129,726 ක ණය මුදල් අයකර නොතිබුණි. |
| (ඇ). | 2016 ජනවාරි 14 දිනැති අංක 1950 දරන ගැසට් නිවේදනය | 2016 ජනවාරි 01 දින සිට ත්‍රී රෝද රථයකින් රු.150 ක මාසික ගාස්තුවක් අයකරන බව ප්‍රකාශයට පත්කර තිබුණද වලපනේ ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයේ සහ නිල්දණ්ඩාහින්න උපකාර්යාල බලප්‍රදේශයේ ත්‍රී රෝද රථවලින් එම ගාස්තු අයකර නොතිබුණි. |
| (ඇ). | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත් සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය. | සභා බලප්‍රදේශයේ තිබෙන ව්‍යාපාර පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර අතරින් ව්‍යාපාර 19 කට පමණක් පරිසර බලපත්‍ර ලබාදී තිබුණි. |

| | |
|---|---|
| (ඉ). පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය. | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක්වත් සිදුකල යුතු වුවද, සභා බලප්‍රදේශය තුළ වරිපනම් දේපළ 2011 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි. |
| (ඊ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (උ). 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,762,074 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,981,425 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,780,649 ක වර්ධනයක් සිදුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,780,649 ක වර්ධනයට ආදායම් විෂයයන් 02 ක ආදායම් වැඩිවීම හා වියදම් විෂයයන් 02 ක වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම්වල වටිනාකම රු.66,657,118ක් සහ ජංගම බැරකම්වල වටිනාකම රු.49,341,132 ක් වූ බැවින් ජංගම අනුපාතය 1.35:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති හිඟ ආදායම් වලින් අයකිරීම් ඉතා දුර්වල තත්ත්වයක පැවති අතර, වර්ෂයේ බිල්කල අක්කර බදු හා කඩ කාමර කුලී අයකිරීමේ තත්ත්වයද සතුටුදායක නොවීය. හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) සහ (ආ) වගන්ති, 159 (1) සහ (2) වගන්ති සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 සිට 67 අනුව කටයුතු කර නොතිබුණි.

2.4.2 බදු කුලී

සභාවේ පොදු වෙළඳපල පිහිටි කඩ කාමර 03 ක බදුකරුවන් විසින් මාස 03 සිට 57 දක්වා කාල පරාසයක් තුළ රු.460,260 ක බදුකුලී ගෙවීම පැහැර හැර තිබුණද, කඩ කාමර පවරාගෙන හෝ හිඟ කුලී අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර හෝ නොතිබුණු අතර, කඩ කාමර සභාවට භාරදෙන ලෙසට බදුකරුවන්ට දන්වා තිබුණු බව පමණක් නිරීක්ෂණය විය.

2.5 අධිභාර

ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ වගකිවයුතු අයවළුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර වලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.29,975 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 26 දිනැති අංක පී 1/ 05/ එස්ජ් - 2 දරන ලිපිය අනුව එම අමාත්‍යාංශය මගින් මිලදී ගෙන පළාත් පාලන ආයතන වලට ලබාදි ඇති වාහන 2017 ජනවාරි 06 දිනට පෙර අදාල පළාත් පාලන ආයතන වෙත පවරාගන්නා ලෙසත්, එසේ පවරා ගැනිම ප්‍රමාද වීම සම්බන්ධයෙන් ගෙවිය යුතු දඩ මුදල් සම්බන්ධ වගකීම අදාල පළාත් පාලන ආයතන විසින් භාරගත යුතු බවත් දන්වා තිබුණද, එවැනි වාහන 03 ක්, 2017 අගෝස්තු 30 දින වන විටත් පවරා ගෙන නොතිබුණි.

(ආ). සභාවට අයත් ධාවන තත්ත්වයේ නොමැති වාහන 06 ක් හා ට්‍රැක්ටර් ටේලරයක් වසර 01 සිට වසර 11 දක්වා කාල පරාසයක් තුළ අනාරක්ෂිතව දිරාපත් වෙමින් සභා භූමියේ රඳවා තිබුණු අතර අළුත්වැඩියා කල හැකි වාහන හඳුනාගෙන අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට සහ අළුත්වැඩියා කල නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---------------------------------

සභාවට අයත් බැකෝ ලෝඩරය 2016 ජූනි 26 දින ක්‍රියාවිරහිත වී තිබුණු අතර එය පෞද්ගලික ආයතනයක් වෙතින් අළුත්වැඩියා කරගෙන තිබුණි. පෞද්ගලික ආයතනය විසින් වාහනය අළුත්වැඩියාව සඳහා රු.811,578 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර, නිෂ්පාදකයා නිර්දේශ කර ඇති ප්‍රමිතියට හා නිසි කාලයට සේවාවන් සිදු නොකිරීම හා නිර්දේශිත ලිහිසි තෙල් නොයෙදීම යන්ත්‍රය ක්‍රියාවිරහිත වීමට හේතුව බව එම ආයතනය වාර්තා කර තිබුණි.

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.13 වගන්තිය අනුව අදාළ අළුත්වැඩියාව සඳහා ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර, අළුත්වැඩියාවෙන් පසුවද ඉංජිනේරුවරයෙකුගේ හෝ වෙනත් වගකිවයුතු නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගැනීමකින් තොරව බිල්පතේ සඳහන් මුදල ගෙවා තිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර වසර 02 කට අධික කාලයක සිට නිශ්කාර්යව කාර්යාල භූමියේ රඳවා තිබුණි.

| යන්ත්‍ර පිළිබඳ විස්තරය | | නිරීක්ෂණ |
|---|---|---|
| විදුලි ජනන යන්ත්‍රය | - | 2007 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ලබාදී ඇත. |
| විශාල ප්‍රමාණයේ කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය | - | ලැබුණු දින හෝ වෙනත් තොරතුරු අනාවරණය නොවූ අතර ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. |
| කොම්පෝස්ට් සාදන යන්ත්‍රය (කුණු අඹරන යන්ත්‍රය) | - | තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| අන්තර් කුට්ටි ගල් නිෂ්පාදනය සඳහා මිලදීගත් කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍ර 02 | - | ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. |

3.4 සන අපද්‍රව්‍ය කළමනාකරණය

නිල්දණ්ඩාහින්න කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). විධිමත් පරිදි කසළ කළමනාකරණය නොකර පොලිතීන් ඇතුළු නොදිරන කසළ මධ්‍යස්ථාන භූමියේ දමා තිබුණි.

(ආ). ප්‍රධාන මාර්ගයේ සිට කසළ මධ්‍යස්ථානය දක්වා ඇති මාර්ගය දෙපස පොලිතීන් ආදිය දමා තිබුණි.

(ඇ). දිරාපත් වන කසළ යොදාගෙන සිදුකරනු ලබන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය විධිමත් පරිදි ක්‍රියාත්මකකර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 09 සිට සියයට 85 ක් දක්වාද, වියදම් විෂයයන් 05 ක සියයට 10 සිට සියයට 84 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය. | සභාවට ලැබිය යුතු මුදල් අය නොකිරීම සහ සභාව විසින් ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කර නොතිබීම. |
| (ඇ). | ගිණුම්කරණය. | ගිණුම් වර්ෂයට අදාළ වත්කම් සහ බැරකම් ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීමේදී විවිධ අඩුපාඩු සිදුවී තිබීම. |